# විශේෂ නිවේදනය

## ශ්‍රී ලංකා නීති විද්‍යාල (සාමාන්‍ය) ප්‍රවේශ විභාගය -2023

**නීති විද්‍යාල (සාමාන්‍ය) ප්‍රවේශ විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම් සපුරාලීමට නොහැකි අයදුම්කරුවන් සඳහා අවස්ථාව ලබා දීම.**

දැනට විභාග අයදුම්පත ඉදිරිපත් කිරීමට අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම් නොමැති අයදුම්කරුවන්හට පහත කොන්දේසි යටතේ 2023 අගෝස්තු මස 16 වන දින දක්වා මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් යොමු කිරීමට අවස්ථාව ලබා දී ඇත.

1. මාර්ගගත අයදුම්පතෙහි තම ප්‍රතිඵල සඳහන් කිරීමේදී, පෙනී සිටි විශයන් සඳහන් කොට, විභාග අංකය යෙදීම ප්‍රමාණවත් වේ.

2. අයදුම්කරුවන් නීති ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල නිකුත් වන අවස්ථාව වන විට ඔබගේ අධ්‍යාපනික සුදුසුකම් සපුරා තිබිය යුතු වන අතරම සහතික කරන ලද තම ප්‍රතිඵල ලේඛන ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීති ප්‍රවේශ අංශය වෙත පැමිණ භාරදිය යුතු ද වේ.

3. නීති ප්‍රවේශ විභාගය සඳහා අයදුම්පත යොමු කිරීමෙන් පසු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඔබට ලබා දී ඇති යොමු අංකය (Reference Number) තම ප්‍රතිඵල නීති විද්‍යාලය වෙත ඉදිරිපත් කිරීමේදී ලබා දිය යුතුය. (ඉහත අංක 02 අනුව කටයුතු කිරීමේදී)

4. තම තහවුරු කරන ලද අධ්‍යාපනික ප්‍රතිඵල ඉහත අංක 02 කොන්දේසියේ සඳහන් පරිදි නීති විද්‍යාලයට ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, ඔබ විසින් නීති ප්‍රවේශ විභාගය සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත අවලංගු වනු ඇත.

5. කිසිදු හේතුවක් මත නීති ප්‍රවේශ විභාගය සඳහා ගෙවන ලද නීති විද්‍යාල ගාස්තුව සහ විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

විදුහල්පති
ශ්‍රී ලංකා නීති විද්‍යාලය
2023.08.12